1980 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ තොග අලෙවි මිල දර්ශකය ද පසුගිය වසරට වඩා සීඝ්‍ර වර්ධනයක් පෙන්විය. 1978 වර්ෂයේදී සියයට 16 කින් ද, 1979 වර්ෂයේ දී සියයට 9 කින් ද, වර්ධනය වූ දර්ශකය 1980 වර්ෂයේ දී සියයට 34 ක වර්ධනයක් පෙන්නුම් කළේය. තොග අලෙවි මිල දර්ශකයේ ඇතිවූ වර්ධනයෙන් සියයට 38 ක සිදුවී ඇත්තේ දේශීය භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසා වන අතර පිළිවෙළින් සියයට 25 ක් සහ සියයට 36 ක් සිදුවී ඇත්තේ අපනයන සහ ආනයන භාණ්ඩයන්ගේ මිල වැඩි වීමෙනි.

තවදුරටත් පැහැදිලි වන්නේ දර්ශකයේ වර්ධනයෙන් සියයට 72 ක් පාරිභෝගික භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසා ද, සියයට 24 ක් අන්තර් භාණ්ඩවල මිල වැඩිවීම නිසා සහ ඉතිරි සියයට 4 ක් ආයෝජන භාණ්ඩයන්ගේ මිල වැඩිවීම නිසාද සිදුවී ඇති බවය.

පවත්නා මිල ගණන් අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයේත්, 1970 ස්ථාවර මිල ගණන් අනුව වූ දළ ජාතික නිෂ්පාදිතයේත් අනුපාතය වන ගම්‍ය මිල දර්ශකය ද සමාන උපනතියක් පෙන්වමින් 1980 වර්ෂයේ දී සියයට 18 කින් වර්ධනය විය. මීට ඉහත වසර දෙක තුළ දී එය වර්ධනය වී ඇත්තේ සියයට 15 කින් පමණි.

1980 වර්ෂයේ ඇති වූ මිල මට්ටමේ තියුණු වැඩිවීම කරුණු කීපයක සංකලනයකි. මෙයට රුපියල අවප්‍රමාණය කිරීම නිසා ඇති වූ මිල වෙනස්වීම්, වැඩි කරන ලද සමහර බදු ප්‍රමාණයන්, උපයෝජන හා සේවා ගාස්තුවල ආරෝහන ප්‍රතිශෝධනයන්, ඛණිජ තෙල් නිෂ්පාදනයන්ගේ මිල වැඩිවීම, විදේශීය වෙළෙඳපොළවල මිල වැඩිවීම සහ ප්‍රධාන පාරිභෝගික භාණ්ඩයන්ගේ ආරෝහණ මිල ප්‍රතිශෝධනයන් යනාදී පිරිවැය වැඩිවීමට හේතුවන කරුණු ඇතුළත් වේ. ඊට අමතරව රාජ්‍ය වියදමේ සාන්තතික ප්‍රසාරණයන්, සංක්‍රමණික කම්කරුවන් නිසා වැඩි වූ විනිමය ප්‍රේෂණයන් සහ සාන්තතික දේශීය මූල්‍ය ප්‍රසාරණය වැනි ඉල්ලුම වැඩි කිරීමට අඩුදෙන කරුණු ද ඇතුළත් වේ.

එක් වසරක් තුළ සියයට 30 ක වේගයකින් මිල මට්ටම වෙනස්වීම දැඩි සැළකිල්ලට භාජනය කළ යුතු කරුණකි. මේ ප්‍රමාණයෙන් මිල මට්ටමේ වැඩිවීමක් නිසා ව්‍යාපෘති පිරිවැය ගණනය දුෂ්කර කර්තව්‍යයක් වනු ඇත. අනාගතයේදී තවදුරටත් මිල මට්ටමේ වැඩිවීමක් ඇතිවෙතැ'යි සංකල්පනය කිරීමෙන් ප්‍රාග්ධන ව්‍යාපෘතීන් ඇරඹීම පිළිබඳව අහිතකර වාතාවරණයක් ඇතිවීමට ඉඩ තිබේ. මිල මට්ටමේ වැඩිවීමේ උපනති මර්ධනය කිරීම පිණිස උචිත මිල ස්ථාවරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක නො කළහොත් අධිවේග සහ ස්වයංක්‍රීය මිල වැඩිවීමක් සිදුවී සංවර්ධන ප්‍රයත්නයන් අඩාල වීමට ඉඩ ඇත.

## වැටුප්

1980 වර්ෂයේදී රාජ්‍ය සේවකයන්ගේ සහ වේතන මණ්ඩල රෙගුලාසිවලට යටත් වන පුද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් අඩුවිය.

1980 වර්ෂයේ රජයේ සේවකයන්ගේ මූල්‍ය වැටුප්වල වර්ධනය 1979 දී සිදු වූ වර්ධන වේගයට වඩා අඩුවිය. පසුගිය වර්ෂයේදී සියයට 16 කින් වැඩි වූ කාර්මික හා ලිපිකරු සේවකයන්ගේ මූල්‍ය වැටුප් දර්ශකය 1980 දී වැඩිවූයේ සියයට 10 කින් පමණි. මේ අතර සුළු සේවකයන්ගේ සහ පාසල් ගුරුවරුන්ගේ මූල්‍ය වැටුප්වල වැඩිවීම 1979 දී පිළිවෙළින් සියයට 21 ක් සහ සියයට 15 ක්වූ අතර, 1980 වර්ෂයේ දී එය සියයට 12 ක් සහ සියයට 9 ක් විය. රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූල්‍ය වැටුප් මෙසේ වැඩිවීමට ප්‍රධානම හේතුව වූයේ 1980 නොවැම්බර් මාසයේ දී වූ රුපියල් 70 ක වැටුප් වැඩි කිරීමයි.

1978 සහ 1979 වසර වල දී සියයට 7 කින් වැඩි වූ රජයේ සේවකයන් සඳහා වන මූර්ත වැටුප් දර්ශකය[1] 1980 වර්ෂයේ දී සියයට 11·6 ක අඩුවීමක් පෙන්විය. එමෙන්ම 1979 වසරේදී සියයට 5 කින් වැඩි වූ කාර්මික සහ ලිපිකරු සේවකයන්ගේ මූර්ත වැටුප් මෙම වසරේදී සියයට 13 කින් අඩුවිය. තව ද පසුගිය වසරේ දී සියයට 9 කින් වැඩි වූ සුළු

1. මූර්ත වැටුප් ගණනය කොට ඇත්තේ මූල්‍ය වැටුප් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයෙන් අවධමනය කිරීමෙනි.

# වැටුප් ප්‍රමාණ දර්ශක අංක

1952 = 100



සේවකයන්ගේ මූර්ත වැටුප් 1980 දී සියයට 12 කින් අඩු වූ අතර, 1979 වසරේ සියයට 4 ක වැඩිවීමක් පෙන්නුම් කළ රජයේ පාසල් ගුරුවරුන්ගේ මූර්ත වැටුප් සියයට 14 කින් පහත වැටිණි.

1980 වර්ෂය තුළ දී පුද්ගලික අංශයේ කෘෂිකාර්මික සේවකයන්ගේ මූල්‍ය වැටුප් සියයට 25 කින් වැඩි වූ අතර කර්මාන්ත හා වාණිජ අංශයේ සේවකයන්ගේ මූල්‍ය වැටුප් සියයට 22 කින් වර්ධනය විය. 1979 සඳහා වූ සංසන්දිත සංඛ්‍යා වනුයේ පිළිවෙළින් සියයට 28 සහ සියයට 17 කි. මේ අතර පසුගිය වසරේ දී සියයට 27 කින් වැඩි වූ පුද්ගලික අංශයේ සේවකයන් සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය වැටුප් දර්ශකය මෙම වසරේ දී සියයට 25 කින් වැඩිවිය.

එහෙත් 1979 වර්ෂයේ දී සියයට 15 කින් වැඩි වූ කෘෂිකාර්මික සේවකයන්ගේ මූර්ත වැටුප් 1980 වර්ෂයේ දී සියයට 0·2 ක අඩුවීමක් පෙන්විය. එමෙන්ම 1979 වර්ෂයේ දී සියයට 5 කින් වැඩි වූ කර්මාන්ත හා වාණිජ අංශයන් හි සේවකයන්ගේ මූර්ත වැටුප් 1980 වර්ෂයේ දී සියයට 3 කින් පහත වැටිණි.

## විදේශීය වෙළෙඳාම

ශ්‍රී ලංකාවේ වෙළෙඳ තුලනය (රේගු සංඛ්‍යා අනුව), 1980 දී රුපියල් දශ ලක්ෂ 16,364 (විගැහි දශලක්ෂ 761) ක හිඟයක් පෙන්නුම් කළ අතර, මෙය 1979 වෙළෙඳ තුලනය වූ රුපියල් දශලක්ෂ 7,287 (විගැහි දශලක්ෂ 362) සමග සැසඳූ කල සියයට 125 (විගැහි වටිනාකම් අනුව සියයට 110) ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. 1980 වර්ෂයේ අවාසිදායක වෙළෙඳ තත්ත්වයට හේතු වූ ප්‍රධාන සාධකය වූයේ, ආනයන වටිනාකම රුපියල් දශ ලක්ෂ 33,637 (විගැහි දශ ලක්ෂ 1,563) දක්වා රුපියල් දශ ලක්ෂ 11,077 කින් හෙවත් සියයට 49 (විගැහි අනුව සියයට 39) කින් තියුණු ලෙස වැඩිවීමය. මීට ප්‍රතිවිරුද්ධ ලෙස අපනයන ඉපැයීම් සියයට 13 (විගැහි අනුව සියයට 6) කින් පමණක් වැඩිවී රුපියල් දශ ලක්ෂ 17,273 (විගැහි දශලක්ෂ 803) විය. කල්පමාවකින් පසුව වාර්තා කරන ලද ඇතැම් රාජ්‍ය ආයතනයන්හි ආනයන හා අපනයන සඳහා රේගු සංඛ්‍යා ගැලපූ කල්හි 1980 වර්ෂයේ වෙළෙඳ හිඟය රුපියල් දශ ලක්ෂ 15,561 විය.

### 1 · 22 සංඛ්‍යා සටහන

### 1978—1980 වෙළෙඳ තුලනය

වටිනාකම රුපියල් දශ ලක්ෂ
(වරහන් තුල විගැහි දශ ලක්ෂ)

| වර්ෂය | ආනයන | | අපනයන | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා |
| 1978 | 14,687 (774)(අ) | 15,100 | 13,206 (674) | 13,193 | – 1,480 (–100) | – 1,907 |
| 1979 (ආ) | 22,560 (1,121) | 22,602 | 15,273 (759) | 15,282 | – 7,287 (–362) | – 7,320 |
| 1980 | 33,637 (1,563) | 33,360 | 17,273 (803) | 17,799 | –16·364 (–761) | –15,561 |

(අ) 1977 නොවැම්බර් 15 පසුව කරන ලද ගනුදෙනු සම්බන්ධව එදිනට පෙර පැවති අනුපාත අනුව විගැහි වටිනාකම ගලපන ලදී.

(ආ) සංශෝධිතයි.

මූලයයන්; ශ්‍රී ලංකා රේගුව;
ආහාර කොමසාරිස්ගේ දෙපාර්තමේන්තුව,
ලංකා පොහොර සංස්ථාව;
ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව;
රාජ්‍ය මැණික් සංස්ථාව.